ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017/12/21 |

## 2017 නොවැම්බර් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2017 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 8.8 ට සාපේක්ෂව 2017 නොවැම්බර් මාසයේ දී සියයට 8.4 ක් දක්වා පහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි. දර්ශකයෙහි වෙනස 2017 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ සියයට 7.1 හි සිට 2017 නොවැම්බර් මාසයේ දී සියයට 7.5 දක්වා ඉහළ ගියේය.

මාසික වෙනස්වීම සැලකූ විට, ජා.පා.මි. දර්ශකය 2017 ඔක්තෝබර් මාසයේ වාර්තා වූ දර්ශක අංක 124.8 හි සිට 2017 නොවැම්බර් මාසයේ දී දර්ශක අංක 126.4 දක්වා ඉහළ ගියේය. සැපයුම් අංශයෙහි අහිතකර ප්‍රවණතා හේතුවෙන් ආහාර කාණ්ඩයට අයත් අයිතමයන්හි මිල ගණන් ඉහළ යෑම, මෙම මාසික ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. පොල්, අමු මිරිස් සහ එළවළු වල මිල ගණන් ඉහළයෑම ප්‍රමුඛ විය. කෙසේ නමුත්, මාළු සහ පළතුරු මිල ගණන් පහළ ගියේය.

මේ අතර, වෛද්‍ය රසායනාගාර ගාස්තු සහ පුද්ගලික රෝහල් කාමර ගාස්තු වල ඉහළ යෑමක් නිරීක්ෂණය කරන ලදි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි. දර්ශකයෙහි මූලික උද්ධමනය, වසරේ මුල් මාසවල සිට පෙන්නුම් කළ ආකාරයට තව දුරටත් පහළ යෑමේ නැඹුරුවක් අනුගමනය කළේය. ඒ අනුව, ලක්ෂ්‍යමය පදනම මත 2017 ඔක්තෝබර් මාසයේ දී පැවති සියයට 4.1 හි සිට 2017 නොවැම්බර් මාසයේ දී සියයට 2.8 දක්වා පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2017 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ සියයට 5.6 හි සිට 2017 ඔක්තෝබර් මාසයේ දී සියයට 5.2 දක්වා පහළ ගියේය.



# ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

## පදනම : 2013 = 100

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2016 | ජනවාරි | 112.0 | 113.4 | -1.1 | 0.4 | -0.7 | 3.0 | 2.9 | 4.3 |
| | පෙබරවාරි | 110.8 | 113.9 | -1.1 | 0.4 | 1.7 | 4.6 | 2.6 | 4.4 |
| | මාර්තු | 110.0 | 114.3 | -0.7 | 0.4 | 2.2 | 5.0 | 2.4 | 4.5 |
| | අප්‍රේල් | 111.6 | 115.7 | 1.5 | 1.2 | 4.3 | 5.9 | 2.6 | 4.7 |
| | මැයි | 113.7 | 117.5 | 1.9 | 1.6 | 5.3 | 7.2 | 2.7 | 5.0 |
| | ජූනි | 116.1 | 118.2 | 2.1 | 0.6 | 6.4 | 7.5 | 3.1 | 5.3 |
| | ජූලි | 115.2 | 117.9 | -0.8 | -0.3 | 5.8 | 6.8 | 3.4 | 5.5 |
| | අගෝස්තු | 113.3 | 117.4 | -1.6 | -0.4 | 4.5 | 6.0 | 3.6 | 5.6 |
| | සැප්තැම්බර් | 113.5 | 117.7 | 0.2 | 0.3 | 4.7 | 5.7 | 3.8 | 5.7 |
| | ඔක්තෝබර් | 114.7 | 118.2 | 1.1 | 0.4 | 5.0 | 5.7 | 4.0 | 5.7 |
| | නොවැම්බර් | 116.6 | 120.4 | 1.7 | 1.9 | 4.1 | 6.8 | 4.0 | 5.8 |
| | දෙසැම්බර් | 118.0 | 120.5 | 1.2 | 0.1 | 4.2 | 6.7 | 4.0 | 5.9 |
| 2017 | ජනවාරි | 119.3 | 121.4 | 1.1 | 0.7 | 6.5 | 7.1 | 4.6 | 6.2 |
| | පෙබරවාරි | 119.9 | 122.0 | 0.5 | 0.5 | 8.2 | 7.1 | 5.1 | 6.4 |
| | මාර්තු | 119.5 | 122.3 | -0.3 | 0.2 | 8.6 | 7.0 | 5.6 | 6.6 |
| | අප්‍රේල් | 121.0 | 122.5 | 1.3 | 0.2 | 8.4 | 5.9 | 6.0 | 6.6 |
| | මැයි | 121.8 | 123.0 | 0.7 | 0.4 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජූනි | 123.4 | 123.1 | 1.3 | 0.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | -0.8 | -0.2 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | -0.1 | 0.1 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 0.8 | 0.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |
| | ඔක්තෝබර් | 124.8 | 123.1 | 1.2 | 0.0 | 8.8 | 4.1 | 7.1 | 5.6 |
| | නොවැම්බර් | 126.4 | 123.8 | 1.3 | 0.6 | 8.4 | 2.8 | 7.5 | 5.2 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව